# ලියා දක්වන වග

**දැනුම විනෝදය ආශ්වාදය ඔබ වෙත රැගෙන එන අතරේ ඔබේ සහ ශ්‍රී ලංකාවේ සිටින ඔබේ නෑදෑ හිතවතුන්ගේ ආරක්ෂාව පිණිස ඔවුන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආරක්ෂාව පිලිබදව ලිපිද අප ඔබ වෙත ඉදිරිපත් කළෙමු.**

**පසුගිය පෙබරවාරි කළාපයෙන් අප පෙන්වා දුන් මුස්ලිම් අන්තවාදය ලංකාවේ ක්‍රියාත්මක වීම පිළිබදව වූ ලිපිය ඔබට මතක ඇතැයි සිතමු.. එය ඒ අයුරින්ම අද වන විට ලංකාවේ සිදුව ඇත. මෙවන් අපගේ ගවේශනාත්මක ලිපි සම්බන්ධව අවධානයෙන් පසු වන ලෙස ඔබට දැනුම් දීමට කැමැත්තෙමු.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D**
Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
චික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.



# ජාතියේ අවාසනාව සහ ජාතික ආරක්ෂාව.

**රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර.**

පාස්කු ඉරිදා කතෝලික පල්ලිවලට සහ කොළඹ හෝටල් වලට එල්ල වූ මුස්ලිම් අන්තවාදී මරාගෙන මැරෙන ත්‍රස්තවාදී ප්‍රහාර වලින් 300 කට අධික පිරිසක් මිය ගිය අතර, 500 කට අධික පිරිසක් තුවාල විය. මෙවන් ඛේදනීය අවස්ථාවක් යොදා ගනිමින් දේශපාලනමය සංවාදයක යෙදීම කිසිසේත්ම උචිත නොවේ. නමුත් ඉතාමත් පහසුවෙන් මෙවන් භයානක ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමට ඉඩ සලසමින් රටේ ජනතාවගේ අහිංසක ජීවිත ඉතා අවදානම් තත්ත්වයකට මෙසේ පත් පත්කරනු ලැබුවේ දේශපාලඥයින්ගේ ආත්මාර්ථකාමී, නින්දිත, කුහක, පාලන ක්‍රමය හෝ ප්‍රතිපත්ති නිසා නම් ඒබව ජනතාව දැනගත යුතුය.

මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් දැනට මත දෙකක් ඉදිරිපත්ව තිබේ. පළමුවැන්න මීට මාස කිහිපයකට පෙර නවසීලන්තයේ කතෝලික මිනීමරුවෙක් විසින් මුස්ලිම් පල්ලි දෙකක යාඥා කරමින් සිටි මුස්ලිම් බැතිමතුන් කිසිම හේතුවකින් තොරව වෙඩි තබා ඝාතනය කිරීම නිසා යන්නයි. දෙවැන්න, මෙවන් සිද්ධියක් හිතා මතා සිදු කළේ ඇමරිකාවට ලංකාව තුළ පය ගැසීමට මාර්ගයක් පහසුවෙන් නිර්මාණය කර ගැනීමටය යන්නයි.

ලංකාව තුළ මුස්ලිම් ජනතාවට විරුද්ධව කිසිම ප්‍රකෝපකාරී ක්‍රියාවක් සිදු නොවූ තත්ත්වය ක් මත නවසීලන්තයේ මුස්ලිම් වරුන් ඝාතනය වීමේ සිද්ධියකට පලිගනු වස්, මේසා විශාල (සිංහල) ජනතාවක් ඝාතනය කිරීමට අයිඑස් ත්‍රස්තයින් ලෝකයේ සෙසු රටවල් අතරින් ලංකාව තෝරා ගත්තේ ඇයි ? අනෙක් පැත්තෙන් මෙය ඇමරිකානු දේශීය කුමන්ත්‍රණයක් නම් එම කුමන්ත්‍රණය ඉතා ලේසියෙන් දියත් කිරීමට වාතාවරණයක් ලංකාව තුළ උදා වී තිබුනේ කෙසේද ?



හේතුව මේ දෙකින් කුමක් වුවත් අපේ රටේ මේ ලෙස අහිංසක ජීවිත විශාල සංඛ්‍යාවක් ඝාතනය වූයේ රටේ ජාතික ආරක්ෂාව බිංදුවටත් පහළට දමා තිබූ නිසාය. මරාගෙන මැරෙන බෝම්බ කරුවන් පල්ලිවලට සහ හෝටල් වලට ආ ගිය අන්දම දැන් පටිගත කළ කැමරා දර්ශන මගින් දැක බලා ගත හැක. කිලෝ ගණනක් බර බෝම්බ සහිත බෑගයක් පිටේ දරාගෙන ඉතා සාමාන්‍ය ලෙස ඇවිදමින් වරෙක ළඟ සිටින දරුවෙකුගේද හිස අතගාමින් සෙනග ගැවසෙන තැන්වල එහාට මෙහාට යන හෝ ඇතුල් වන එකා මොකාද කියා ඇසීමට හෝ පරීක්ෂා කිරීමට හෝ පොලිස් නිලධාරියෙකු හෝ පාරේ යන මගියෙක් හෝ නොපෙළඹුණේ රට තුළ ජන ජීවිතයට එවන් කිසිම තර්ජනයක් නැතැයි ද, ඒ නිසා කවරෙක් දෙස හෝ සැකෙන් බැලීම අනවශ්‍යයයිද යන හැඟීම වර්තමාන දේශපාලනඥයෝ ඉතා අමනෝඥ ලෙස ජන සමාජය තුළ ස්ථාපිත කර තිබූ නිසාය. එසේනම් මේ ප්‍රහාරයට වගකීව යුත්තේ පොලිස්පති හෝ ආරක්ෂක ලේකම් වරයා හෝ පමණක් නොව, අගමැති කැබිනට් මණ්ඩලය ඇතුළු රජයේ සියලුම මැති ඇමතිවරුන්ය. හේතුව ජනතාවගේ ආරක්ෂාව ස්ථාපිත කළ යුත්තේ ජනතාව පාලනය කරන රජය බැවිනි. දේශය පාලනය කරන්නේ දේශපාලඥයින් නිසා දේශයේ ජනතාවට අගතියක් වුවහොත් එහි පූර්ණ වගකීම බාරගත යුත්තේ බලයේ සිටින දේශපාලඥයින්ය. වෙනත් රටක නම් අද වන විට රජයේ කැබිනට් මණ්ඩලය අස්වී හමාරය. නමුත්, හිරි ඔතප යන්න අංශු මාත්‍රයක් වත් නොමැති, තමාගේම රටේ තම සහෝදර ජනතාව සිය ගණනක් මරු තුරුළට ගොස් තිබෙන මොහොතක පවා සිනහ සෙමින් එකිනෙකාට ඇඟිල්ල දික් කර ගනිමින් මාධ්‍ය සාකච්ඡා පවත්වන අපේ මිනිස් වෙස්ගත් තිරශ්චීන ඇමති මණ්ඩලයෙන් එවැන්නක් කිසිදා බලාපොරොත්තු විය නොවේ. ඔවුන් බෙල්ලෙන් අල්ලා එළියට දැමීම සඳහා ජනතාව පෙළ